---

**විසර්ජන ශීර්ෂය 124 - සමාජසේවා අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය**

---

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

**I කොටස -** අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව.

**II කොටස -** එක් එක් විසර්ජන ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව.

**1 කොටස**

---

**සමාජසේවා අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව.**

---

**01.** අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු

| වැය ශීර්ෂය | දෙපාර්තමේන්තුවේ නම |
|---|---|
| **216** | සමාජ සේවා දෙපාර්තමේන්තුව |

**02 .** ගිණුම්

**2.1** විසර්ජන ගිණුම

**(අ)** මුළු ප්‍රතිපාදනය හා වියදම

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.1,713,052,350 ක් වූ අතර, ඉන් රු.1,574,447,852 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් පිළිවෙලින් රු.117,541,694 ක් හා රු. 21,062,804 ක් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 8.5 ක් හා සියයට 6.2 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| විසර්ජන ශීර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | | 2012 දෙසැම්බර් 31 දිනට උපයෝජනය | | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන රු. | මූලධන රු. | පුනරාවර්තන රු. | මූලධන රු. | පුනරාවර්තන රු. | මූලධන රු. |
| 124 | සමාජ සේවා අමාත්‍යාංශය | 1,199,046,000 | 175,818,000 | 1,175,353,783 | 81,968,523 | 23,692,217 | 93,849,477 |
| 216 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 307,538,350 | 30,650,000 | 296,509,022 | 20,616,524 | 11,029,328 | 10,033,476 |
| එකතුව | | 1,506,584,350 | 206,468,000 | 1,471,862,805 | 102,585,047 | 34,721,545 | 103,882,953 |

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුව වෙත රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබූ පහත සඳහන් සීමාවන් පිළිපැද තිබුණි.

| ශීර්ෂය | විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|---|
| | | උපරිම සීමාව රු. | තථ්‍ය රු. | අවම සීමාව රු. | තථ්‍ය රු. | උපරිම සීමාව රු. | තථ්‍ය රු. |
| 124 | 12401 | 12,000,000 | 5,077,574 | 3,500,000 | 7,959,469 | 48,000,000 | 18,777,518 |
| 216 | 21601 | 18,000,000 | 11,441,987 | 11,200,000 | 13,304,921 | 100,000,000 | 56,952,143 |

## 2.3 <u>අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්</u>

### (අ) <u>අග්‍රිම ගිණුම්</u>

අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දින වන විට අග්‍රිම ගිණුම්වල රු. 148,178 ක් වූ හර ශේෂ හා රු. 180 ක් වූ බැර ශේෂ පැවතුණි.

### (ආ) <u>පොදු තැන්පත් ගිණුම්</u>

2012 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු. 4,416,558 ක් වූ අතර, ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව** | **ගිණුම් අංකය** | **2012 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|---|
| | | **රු.** |
| සමාජ සේවා අමාත්‍යාංශය | 6000/0000/00/0015/0037 | 2,959,421 |
| සමාජ සේවා දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0097 | 1,457,137 |
| එකතුව | | <u>4,416,558</u> |

# 11 කොටස

## එක් එක් විසර්ජන ශීර්ෂයට අදාළ විස්තරාත්මක වාර්තාව

## 1. විසර්ජන ශීර්ෂය 124 - සමාජසේවා අමාත්‍යාංශය

### 1.1 විගණන විෂය පථය

සමාජ සේවා අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ඔක්තෝබර් 15 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය හා ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම.

විසර්ජන ගිණුම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැළසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව සමාජ සේවා අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඊ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.11 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

(i) අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| තොග පොත | මුදල් රෙගුලාසි 751 |
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

(ii) බදුකුලී ගිවිසුම්, බිල්පත්, කාර්මික නිලධාරී සහතික, ප්‍රගති වාර්තා ආදී වූ අවශ්‍ය සාක්ෂි අමාත්‍යාංශයෙහි නොතිබීම නිසා වියදම රු. 100,919,791 ක මුදලට අදාල ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස නිරීක්ෂණය කළ නොහැකි විය.

### (ආ) අයවැය විචලනය

(i) වැය විෂයන් 06 ක් සඳහා සළසා තිබුණු එකතුව රු. 77,890,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයන් 19 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 ත් සියයට 69 අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඈ) <u>ප්‍රතිපාදන මාරු කර ගැනීම</u>**

(i) මනා අධ්‍යානයකින් තොරව ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් මෙහෙයුම් වැඩසටහනේ වැය විෂයයන් 18 කට අදාලව එකතුව රු.8,450,000 ක හෙවත් සියයට 2 සිට සියයට 98 ක පරාසයක් තුළ මුදල් රෙගුලාසි 66 හා 69 යටතේ ප්‍රතිපාදන මාරු කිරීම් සිදු කර තිබුණු අතර, සංවර්ධන වැඩසටහනට අදාලව, වැය විෂයයන් 09ක එකතුව රු.9,076,000 ක් හෙවත් සියයට 8.17 සිට සියයට 93.95 ක පරාසයක තුළ මුදල් රෙගුලාසි 66 හා 99 යටතේ ප්‍රතිපාදන මාරු කිරීම් සිදු කර තිබුණි.

(ii) ඇස්තමේන්තු කිරීමේදී පසුගිය වර්ෂයන්හි වියදම් පිළිබඳ සමාලෝචනය කර සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තු සකස් කිරීම සිදු නොකිරීම හා ඇතැම් විෂයයන්හි අධි වියදම් හේතුවෙන් මුදල් රෙගුලාසි 66 හා 69 මාරු පත්‍ර 3 සිට 5 දක්වා යොදාගෙන එකතුව රු.7,938,000 ක ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණි.

**(ඇ) <u>අග්‍රිම ගිණුම</u>**

(i) මුදල් රෙගුලාසි 371 ට පටහැනිව ගණන්දීමේ නිලධාරියාගේ යටත් නිලධාරීන් නොවන පුද්ගලයින් 03 දෙනෙක් වෙත රු.34,900 ක අත්තිකාරම් ලබාදී තිබුණි.

(ii) සීඩී පිටපත් 300 ක් ලබා ගැනීම සඳහා රු.13,750 ක අත්තිකාරම් අමාත්‍යාංශ නිලධාරියෙකු නොවන පුද්ගලයෙකු වෙත ලබා දී තිබුණි.

**(ඉ) <u>රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය</u>**

(i) විෂය අංක 12401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු. 41,530 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ii) භාණ්ඩාගාර පොත් හා දෙපාර්තමේන්තු පොත් අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු.2,043 ක හඳුනානොගත් ශේෂයක් පැවතුණි.

(iii) 2010 හා 2011 වර්ෂවලදී සිදුවී ඇති රු.233,652 ක ගිණුම්කරණ වැරදි නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

## 1.4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 1.4.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානින්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානින් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් අමාත්‍යාංශය විසින් පිළියෙල කළ යුතු වුවත්, 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්ම 2012 ඔක්තෝබර් 08 දින පිළියෙල කර තිබුණි.

### 1.4.2 වාර්ෂික කාර්යසාධන වාර්තා

ඉහත 1.4.1 ඡේදයේ සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402 හා 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර අමාත්‍යාංශය විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව 2013 සැප්තැම්බර් 24 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 1.4.3 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 26 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව 2012 වර්ෂයට අදාල වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2012 මාර්තු 01 දින පිළියෙල කර තිබුණි.

## 1.5 වත්කම් කළමනාකරණ

### (අ) පවරා නොගත් වත්කම්

තෑගි ඔප්පුවක් මඟින් සමාජ සේවා අමාත්‍යාංශයට පවරා දී තිබුණු අක්කර 01 රූඩ් 02 පර්චස් 9.9 ක ඉඩම හා ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ හා ලංකා බැංකුවේ පවත්වාගෙන යනු ලැබූ ගිණුම් 03 ක ඉතිරිව පැවති මුදල් නීත්‍යානුකූලව අමාත්‍යාංශයට පවරා ගෙන අරමුණු කරා යෙදවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

**(ආ) නිෂ්කාර්ය වත්කම්**

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය විසින් රාජ්‍ය ජාල ව්‍යාපෘතිය හරහා අමාත්‍යාංශයට ලබා දී තිබූ පරිගණක 10 ක්, දුරකථන සබඳතා 05 ක් හා ප්‍රින්ටර් 10 ක් අදාල ව්‍යාපෘති කටයුතු සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි. එම වත්කම් ස්ථාවර වත්කම් ලේඛනයට හා තොග පොත් වලට ඇතුලත් කර නොතිබුණ අතර අවසන් වරට සිදු කළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල ද ඇතුළත් කර නොතිබුණි.

**(ඇ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2012 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 මාර්තු 31 දිනට ප්‍රථම සිදු කර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වූවත්, අමාත්‍යාංශය විසින් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ මාස 7½ ක් ප්‍රමාදයකින් පසු 2013 නොවැම්බර් 15 දිනදීය.

**(ඈ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම.**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වෙනත් ආයතන සතු වාහන 06 ක් 2012 නොවැම්බර් 30 දින වන විට අමාත්‍යාංශයේ කටයුතු සඳහා යොදවා ගෙන තිබූ අතර, එම වාහන පවරා ගැනීමට හෝ භාරදීමට අදාල කටයුතු අවසන් කර නොතිබුණි.

(ii) අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන 2ක වාහන 03ක් අමාත්‍යාංශයේ කටයුතු සඳහා යොදාගෙන තිබුණි.

## 1.6 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි විධිවිධාන වලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) ආයතන සංග්‍රහය | | |
| VI පරිච්ඡේදයේ 2.10 වගන්තිය | 2,837,000 | උපදේශක නිලධාරීන් 20 දෙනෙකු වෙත වැටුප් ගෙවා තිබුණද, පත් කිරීම් සම්බන්ධයෙන් විගණකාධිපති වෙත වාර්තා කර නොතිබුණු අතර අදාළ නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනුද පවත්වා නොතිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි | | |
| (i) මුදල් රෙගුලාසි 104 (1) (3) (4) | - | 2009 වර්ෂයේදී වාහනයකට සිදුවී තිබුණු අනතුර සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා පරිපූර්ණ වාර්තා, ප්‍රාරම්භක වාර්තා හා අවසන් වාර්තා 2012 දෙසැම්බර් 21 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 115 | 1,847,487 | අවස්ථා 2 කදී 2011 වර්ෂය වෙනුවෙන් 2012 වර්ෂයේදී කරන ලද ගෙවීම් සඳහා අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 245 | 243,800 | වවුචර් 07ක් සහතික කිරීමෙන් තොරව ගෙවා තිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 753 | | මිලදී ගනු ලබන ඇස් කණ්ණාඩි ලැබීම් හා නිකුත් කිරීම් තොග පොතට ඇතුළත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ | | |
| 2010 මැයි 14 දිනැති අංක සී.ඒ/1/17/1 දරන රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛයේ 3:1 ඡේදය | | චක්‍රලේඛයට පටහැනිව වාහන වෙන්කර තිබුණි. |
| 5.2 ඡේදය | 13,643 | සම්බන්ධීකරණ ලේකම්වරු දෙදෙනෙකු සඳහා දුරකථන සබඳතා 02 ක් වෙනුවෙන් අමතර ගෙවීම් කර තිබුණි. |
| (ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | |
| 1996 පෙබරවාරි 26 දිනැති අංක 02/99 දරන චක්‍රලේඛයේ 5 ඡේදය | 78,173 | පත් කළ කමිටුවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව ජංගම දුරකථන ලබාදිය යුතු වුවත්, එසේ අනුමැතිය නොලබා ජංගම දුරකථන 25 ක් නිලධාරීන්ට ලබාදී තිබුණි. |
| 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන චක්‍රලේඛයේ 5 ඡේදය | 157,478 | අමාත්‍යාංශ ලේකම්ගේ පෞද්ගලික අනුමැතියකින් තොරව අතිරේක ඉන්ධන ලබා ගෙන තිබුණි. |
| (ඉ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ | | |
| 2003 අප්‍රේල් 03 දිනැති අංක 446 දරන චක්‍රලේඛය | 109,650 | චක්‍රලේඛය ප්‍රකාරව හිමිකම් නොලබන නිලධාරීන්ට ජංගම දුරකථන බිල්පත් සඳහා ගෙවීම් කර තිබුණි. |

1.7 **කාර්යසාධනය**

2012 වාර්ෂික අය වැය ඇස්තමේන්තු, සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලසුම්වලට අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ඉටු නොකළ කාර්යයන්**

(i) උපදේශන මධ්‍යස්ථාන ඉදි කිරීම සඳහා රු.50,000 ක ප්‍රතිපාදන සළසා තිබුණද එම කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ii) 2012 පෙබරවාරි 22 දින හා අංක අ.ම.ප./12/0079/534/001 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි වඩාත් පහසුවෙන් ආපදාවන්ට ලක්විය හැකි කණ්ඩායම් පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් ඔවුන් සඳහා යෝග්‍ය සමාජ ආරක්ෂණ ජාලයක් සළසාදිය හැකි වන පරිදි ප්‍රබල රාමුවක් සහිත පවුල් ප්‍රතිපත්තියක් සකස් කිරීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(iii) වර්ෂය තුළ දිස්ත්‍රික් කමිටු වැඩමුළු කාර්තුමය වශයෙන් 4 බැගින් දිස්ත්‍රික් 24 තුළ 96 ක් පැවැත්විය යුතු වුවත්, කමිටු වැඩමුළු 67 ක් පවත්වා තිබුණ අතර, එය පැවැත්විය යුතු මුළු ගණනින් සියයට 70 කි. නමුත් දිස්ත්‍රික් වැඩමුළු 96 වෙනුවට ක්‍රියාකාරි සැලසුමේ ඉලක්ක ගත දිස්ත්‍රික් කමිටු වැඩමුළු 50 ක් ලෙස දක්වා භෞතික ප්‍රගතිය සියයට 67 ක් ලෙස දක්වා තිබුණි.

(iv) 2012 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ දැක්විය යුතු ඉලක්ක අඩුවෙන් දැක්වීම හේතුවෙන් 2012 වර්ෂයේ දිස්ත්‍රික් කමිටු රැස්වීම්වල ප්‍රගතිය සියයට 92 කින් ද, පළාත් සහායක නිලධාරී වැඩමුළුවල ප්‍රගතිය සියයට 200 කින් ද වැඩියෙන් දක්වා තිබුණි.

(v) සී.බී.ආර්. අත්පොත් මුද්‍රණය කිරීමට සමාලෝචිත වර්ෂයේ සැලසුම් කර තිබුණත්, එය සිදුකර නොතිබුණු අතර, ක්‍රියාකාරී සැලැස්මේ නොමැති ජාතික ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩපිළිවෙල නැමැති පොත මුද්‍රණය කර තිබුණි.

(vi) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් තනිමාපිය පවුල් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු ලබා ගෙන නොතිබුණි.

## 1.8. මතභේදයට තුඩුදෙන ගනුදෙනු

අමාත්‍යාංශය විසින් කර ඇති සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණ වලදී අනාවරණය වූ ගනුදෙනු කිහිපයක විස්තර පහත දැක්වේ.

(අ) 2009 වර්ෂයේදී අනතුරට ලක් වූ වාහනයක් ගර්හිත කිරීමට ජාතික රක්ෂණ භාර අරමුදල නිර්දේශ කර තිබියදීත්, 2011 වර්ෂයේදී අලුත්වැඩියා සඳහා යොමු කර තිබුණු අතර, ඒ සඳහා 2011 වර්ෂයේදී ජාතික රක්ෂණ භාර අරමුදලින් ලබාගත් රු.500,000 ක අත්තිකාරම් මුදලක් පෞද්ගලික ගරාජයක් වෙත ලබා දී තිබුණි. එසේ තිබියදී 2012 දෙසැම්බර් 31 වනතුරු අලුත්වැඩියා කටයුතු අවසන් කර නොතිබුණි.

(ආ) ගබඩාවට ලැබී නොතිබුණ රු.159,250 ක් වටිනා පරිගණකයක් වෙනුවෙන් 2012 දෙසැම්බර් පුද්ගලික සමාගමක් නමින් ලියූ චෙක්පත 2013 ජනවාරි 31 දින වනවිටත් නිකුත් කර නොතිබියදී බැංකු සැසඳුමේ ඉදිරිපත් නොකළ චෙක්පත් යටතේ පෙන්වා තිබුණි.

(ඇ) සමාජ සේවා අමාත්‍යාංශයේ කිසිදු නිලධාරියෙකු සහභාගි නොවී ඇස්කණ්නාඩි බෙදාදුන් බවට ඉදිරිපත් වූ ලේඛන පදනම් කරගෙන රු.422,380 ක මුදලක් සැපයුම් ආයතනයට ගෙවා තිබුණි.

(ඈ) ජංගම සේවා මගින් ඇස් කණ්නාඩි බෙදාහැරීමේදී කණ්නාඩි සැපයුම්කරුවන් අමාත්‍යාංශ ගබඩාවට ඇස්කණ්නාඩි නොසපයා සෘජුව ජංගම සේවා ස්ථානවලට සැපයීම කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එසේ සැපයූ රු.13,749,353 ක් වටිනා ඇස් කණ්නාඩි නිලධාරියකු භාරගත් බවට, කණ්නාඩි ලාභීන්ගෙන් ලබාගත් බවට සනාථයක් හෝ ඇස් කණ්නාඩි ලබාදුන් බවට නිලධාරියෙකුගෙන් ලබාගත් බවට සහතිකයක් නොමැතිව ඒ සඳහා ගෙවීම් කර තිබුණි.

(ඉ) හිටපු අමාත්‍යාංශ ලේකම් විසින් 2012 මාර්තු සිට 2012 ජුලි 13 දින දක්වා ලබාගෙන තිබූ ඉන්ධන දීමනාව රු.159,625 ක් වූ අතර, එම කාලයට ගෙන තිබූ අතිරේක ඉන්ධන වටිනාකම රු.158,717 ක් වූ අතර, එම අගය ඉන්ධන දීමනාවෙන් සියයට 99 ක ප්‍රතිශතයක් විය.

(ඊ) හිටපු අතිරේක ලේකම් (සංවර්ධන) විසින් 2012 අප්‍රේල් සිට දෙසැම්බර් 18 දින දක්වා ලබාගෙන තිබූ අනුමත ඉන්ධන දීමනාව රු.175,950 ක් වූ අතර, එම කාලයට අදාලව

ලබාගෙන තිබුණි. අතිරේක ඉන්ධන වටිනාකම රු.229,195 කි. එය අදාල ඉන්ධන දීමනාවෙන් සියයට 130 ක් වී තිබුණි.

(උ) අතිරේක ඉන්ධන ලබාගැනීමේ අවශ්‍යතාවය දැක්වෙන වැඩසටහන්වලට අදාලව යෝජිත වැඩසටහන් විස්තර, සහභාගිවූවන්ගේ නාම ලේඛන හෝ ප්‍රගති වාර්තා කිසිවක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 1.9. අවිධිමත් ගනුදෙනු

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### (අ) ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියෙන් බැහැර වීම්

(i) අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවට සහය වීමට පත් කරනු ලබන තාක්ෂණික ඇගයීම් කමිටුවක අවම සාමාජික සංඛ්‍යාව 5 ක් විය යුතුය. ඒ අතරින් ප්‍රසම්පාදනය දත් නිලධාරියෙකු දෙපාර්තමේන්තු ප්‍රධානියා පත් කළ නිලධාරියෙකු විෂය විශේෂඥයකු හා අවම වශයෙන් එක් සාමාජිකයෙකු ප්‍රසම්පාදන අස්ථිත්වයේ බාහිර පුද්ගලයෙකු විය යුතු වේ. සුළු කොන්ත්‍රාත් සඳහා තිදෙනෙකුගෙන් සමන්විත තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කළ හැකි වුවද සුළු කොන්ත්‍රාත් සඳහා ප්‍රසම්පාදන කමිටුවක් පත් කර නොතිබියදී ඇස් කණ්ණාඩි මිලදී ගැනීම සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුවට ප්‍රසම්පාදන අස්ථිත්වයේ නියෝජනයක් නොමැති බාහිර නිලධාරීන් තිදෙනෙකු පත් කර තිබුණි.

(ii) 2012 නොවැම්බර් 23 දින වන විට ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියකින් තොරව අමාත්‍යාංශය විසින් රු.2,564,648 ක් වැය කර පෞද්ගලික සමාගමක් වෙතින් ඇස් කණ්නාඩි 22,696 ක් සපයාගෙන තිබුණි.

(iii) 2012 වසරේ ප්‍රතිපාදන අවසන්ව තිබියදී සැපයුම්කරු එකඟ වන්නේ නම් 2013 වසරේදී ගෙවීම් කළ හැකි බවට ප්‍රධාන ගණකාධිකාරිවරිය විසින් ලබාදී තිබුණු නිර්දේශය මත Bifocal වර්ගයේ ඇස් කණ්ණාඩි 250 ක් මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

* 2013 ජනවාරි 15 දින රු.651,900 ක මුදලක් අදාල පෞද්ගලික සමාගමට ගෙවා තිබුණු නමුත් විගණිත දිනය වන 2013 ජනවාරි 18 දින වන තෙක් එම ගෙවීම මුදල් පොතේ සටහන් කර නොතිබුණි.

* වවුචර්වල නම් සඳහන් තැනැත්තන්ට හෝ ඔවුන්ගේ නීත්‍යානුකූල නියෝජිතයන්ට පමණක් ගෙවීම් කළ යුතු වූවත්, රු.651,900 ක චෙක්පත සම්බන්ධීකරණ ලේකම්වරයෙකු වෙත භාරදී තිබුණු අතර, එයට හේතු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

* ගබඩාවට නොලැබුණු එකක් රු.530 ක් වටිනා ඇස් කණ්නාඩි 1,230 ක් බෙදාදී තිබුණු අතර, ඇස් කණ්නාඩි ලාභීන්ට ලබා දුන් බවට නිලධාරියෙකු විසින් සහතික කර නොමැතිව ගෙවීම් සිදු කර තිබුණි.

**(ආ) අධිකාර බලය නොමැති ගනුදෙනු**

(i) අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත බඳවා ගෙන තිබූ උපදේශක තනතුර 2012 අගෝස්තු 31 දිනට අවසන්වී තිබුණ ද සේවා දිගුවක් ලබා නොගෙන වැටුප්, දීමනා හා ඉන්ධන ලෙස මාසිකව රු. 76,440 බැගින් මාස තුනක කාලයක් සඳහා එකතුව රු.229,320 ක මුදලක් ගෙවා තිබුණි.

(ii) රියදුරු මහතෙකු වෙනුවෙන් වැඩිපුර ගෙවන ලද රු. 14,559 ක වැටුපක් නැවත අයකරගෙන නොතිබුණි.

(iii) අතිරේක ඉන්ධන ලබාගැනීමේදී යෝජිත ගමනට පෙර ඒ සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු වුවද, කරන ලද නියැදි පරීක්ෂණයට අනුව එසේ අනුමැතිය ලබානොගෙන එකතුව රු.32,817 ක ඉන්ධන බිල්පත් ප්‍රතිපූරණය කර තිබුණි.

(iv) අතිරේක ඉන්ධන හිමිකම නොතිබියදී, අමාත්‍ය හා නියෝජ්‍ය අමාත්‍ය කාර්ය මණ්ඩලයේ නිලධාරීන් මාසික ඉන්ධන දීමනාවට අමතරව රු.43,542 ක අතිරේක ඉන්ධන ලබාගෙන තිබුණි.

(v) මු.රෙ.135 යටතේ මූල්‍ය බලතල පැවරීමේ ලිපිය අනුව වෙන්කළ වාහන සඳහා රු.10,000 ට වැඩි අතිරේක ඉන්ධන අනුමත කිරීමේ බලය අමාත්‍යාංශ ලේකම් වෙත පවරා තිබූ අතර, ඊට පටහැනි ලෙස ප්‍රධාන ගණකාධිකාරී විසින් රු.33,346 ක අතිරේක ඉන්ධන සඳහා බලය ලබාදී තිබුණි.

(vi) අමාත්‍යාංශයේ හිටපු ලේකම්ට වැඩිපුර ගෙවා තිබූ රු.19,134 ක ඉන්ධන දීමනා මුදල අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 1.10. පාඩු හා හානි

ලංකා රාජ්‍ය ජාල ව්‍යාපෘතියෙන් අමාත්‍යාංශයට ලද භාණ්ඩ වලින් පරිගණක 02, මොනිටර් 01, දුරකථන 01 අස්ථානගතවී තිබුණි.

## 1.11. මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 14 | 10 | 04 |
| (ii) තෘතියික මට්ටම | 03 | 02 | 01 |
| (iii) ද්විතියක මට්ටම | 384 | 145 | 239 |
| (iv) ප්‍රාථමික මට්ටම | 58 | 56 | 02 |
| එකතුව | 459 | 213 | 246 |

(ආ) පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** පුරප්පාඩු තනතුරු 246 පිරවීමට සමාලෝචිත වර්ෂය අවසාන වනවිට නොහැකිවී තිබුණි.

**(ii)** පහත සඳහන් අතිරික්ත කාර්ය මණ්ඩලය සඳහා රු.1,259,399 ක මුදලක් වැටුප් සඳහා ගෙවා තිබුණි.

| තනතුර | අනුමත | තථ්‍ය | අතිරික්ත |
|---|---|---|---|
| **<u>අමාත්‍ය කාර්ය මණ්ඩලය</u>** | | | |
| වීඩියෝ කැමරා ශිල්පී | - | 01 | 01 |
| කැමරා ශිල්පී | - | 01 | 01 |
| කැමරා ක්‍රියාකරු සහායක | - | 01 | 01 |
| රියදුරු | 03 | 08 | 05 |
| **<u>නියෝජ්‍ය ඇමති කාර්යාලය</u>** | | | |
| රියදුරු | 03 | 05 | 02 |

**(iii)** අමාත්‍ය කාර්ය මණ්ඩලයේ සේවයේ නියුතු අමාත්‍යාංශයේ රියදුරන් 04 දෙනෙකු සඳහා ගෙවූ රු. 818,647 ක වැටුපක් අමාත්‍ය කාර්යාල ප්‍රතිපාදන යටතේ දරා නොතිබුණි.

## 2. විසර්ජන ශීර්ෂය 216 සමාජසේවා දෙපාර්තමේන්තුව

---

### 2.1 විගණන විෂය පථය

---

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ඔක්තෝබර් 15 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය හා ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත් හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 2.2 <u>ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම.</u>

විසර්ජන ගිණුම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2.3 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව සමාජසේවා දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.10 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) <u>ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම</u>**

**<u>විගණනය සඳහා සාක්ෂි නොතිබීම</u>**

(i) පරිත්‍යාගශීලියෙකු විසින් ඉඩම් වලින් ලැබෙන ආදායම අනාථභාවයට පත් දරුවන්ගේ ප්‍රයෝජනය සඳහා යොදා ගැනීමට සමාජ සේවා අමාත්‍යාංශයට පරිත්‍යාග කරන ලද, අක්කර 04 රූඩ් 03 පර්චස් 33 ක විශාලත්වයෙන් යුතු අමුණුකුඹුර පොල් ඉඩමෙන්ද, අක්කර 01 රූඩ් 02 පර්චස් 9.9 ක විශාලත්වයෙන් යුතු ගලහිටියාව හා පිල්ලෑව යන කුඹුරෙන්ද, දවටගහලන්ද නැමැති ඉඩමේ පිහිටි රූඩ් 02 පර්චස් 09 ක විශාලත්වයෙන් යුතු බිම් කට්ටියෙහි පිහිටි කඩ කාමර දෙකෙන් ලැබෙන කුලියද, ළමා නිවාස හෝ එවැනි නිවාස සඳහා ප්‍රයෝජනයට ගත් ආකාරය හා ලද ආදායම ගිණුම් ගත කළ ආකාරය පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) පරිත්‍යාගශීලියෙකු විසින් සමාජසේවා අමාත්‍යාංශයට තෑගි ඔප්පුවක් මගින් පවරාදෙන ලද ඔප්පුවේ මුළු මුදල සඳහන් නොවන ඉතිරි කිරීමේ ගිණුම් තුනක ඇති මුදල් ස්ථාවර තැන්පතුවක් බවට පරිවර්තනය කර එයින් ලැබෙන පොලිය අනාථභාවයට පත් දරුවන්ගේ ප්‍රයෝජනය සඳහා යොදා ගතයුතු බව දන්වා තිබුණද, එම ගිණුම්වල පැවති මුදල් වල වර්තමාන තත්ත්වය පිළිබඳ කිසිදු තොරතුරක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(iii) බටුගම්මන වෘත්තීය පුහුණු ආයතනයේ අභ්‍යාසලාභීන්ට මෙවලම් කට්ටල ලබා දීම සඳහා යවන ලද රු. 10,000 මුදලින් අදාල උපකරණ ලබාදුන් බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ)** <u>අයවැය විචලනය</u>

(i) වැය විෂයන් 13 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 ත් සියයට 98 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි. භාණ්ඩාගාරය මගින් වර්ෂය තුළදී ප්‍රමාණවත් පරිදි අක්මුදල් ලබානොදීම හේතුවෙන් ගෙවීම් කටයුතු සිදු කිරීමට නොහැකි වූ අතර එමඟින් 2012 වර්ෂය තුළ ප්‍රතිපාදන ඉතිරිවීමක් පෙන්නුම් කෙරෙන බව අධ්‍යක්ෂක විසින් දන්වා තිබුණි.

(ii) ඇස්තමේන්තු වටිනාකමට සාපේක්ෂව සැසඳීමේදී මුදල් රෙගුලාසි 66 හා 69 මඟින් මාරු කිරීම සියයට 18 සිට සියයට 25 ක ප්‍රමාණයක් ද, පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම මඟින් ප්‍රතිපාදන ලබාගැනීම අයවැය ඇස්තමේන්තු වටිනාකම හා සැසඳීමේදී සියයට 50 සිට සියයට 126 ක ප්‍රමාණයක්ද ගෙන තිබුණි.

(iii) අධි ඇස්තමේන්තු සැකසීම නිසා ඇස්තමේන්තු වටිනාකමට සාපේක්ෂව සැසඳීමේදී වැය විෂයයන් 07 ක මුදල් රෙගුලාසි 66 මඟින් ප්‍රතිපාදන සියයට 9 සිට සියයට 100 ක පරාසයක් තුළ ප්‍රමාණාත්මක ලෙස වැය විෂයයන්ට මාරු කර ගෙන තිබුණි.

**(ඇ)** <u>බාල වයස්කාර තැන්පතු හා ඇප තැන්පතු</u>

(i) වයස අවුරුදු 18 සම්පූර්ණ වී තිබුණත්, මෙතෙක් නිදහස් නොකළ බාල වයස්කාර තැන්පතු ගිණුම් 07 ක රු. 14,085 ක ශේෂයක් පැවතුණි.

(ii) **වසර 16** සිට 34ත් අතර කාල පරාසයක් තුල සේවයෙන් ඉවත් වී ගිය නිලධාරීන්ගේ ඇප තැන්පතු එකතුව රු.6,208ක් 2012 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

**(ඇ)** <u>රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය</u>

(i) ආපදා ණය ශේෂයක වටිනාකම රු.89,976 ක් වුවත් එය රු. 87,976 ක් ලෙස ගිණුමේ දක්වා තිබීමෙන් රු. 2,000 ක වෙනසක් පැවතුණි.

(ii) පුද්ගලයන් 09 දෙනෙකුගෙන් ණය වාරික ලෙස රු. 5,000 ක මුදලක් වැඩිපුර අයකර තිබුණි.

(iii) විෂය අංක 21601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂ

වල එකතුව රු. 602,049 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

**2.4 ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**2.4.1 සංයුක්ත සැලැස්ම**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානින්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානින් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙළ කළ යුතු වුවත්, එම සැලැස්ම 2011 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙළ කර නොතිබුණි. සංයුක්ත සැලැස්ම විගණනය වෙත ඉදිරිපත් කර තිබුණේ 2012 ජූලි 24 දිනදීය.

**2.4.2 වාර්ෂික කාර්යසාධන වාර්තා**

ඉහත 2.4.1 ඡේදයේ රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402 හා 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභා ගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණේ 2013 සැප්තැම්බර් 04 දිනදීය.

**2.4.3 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 26 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව 2012 වර්ෂයට අදාල වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණි.

**2.5 වත්කම් කළමනාකරණය**

**2.5.1 නිෂ්කාර්ය වත්කම්**

වෘත්තීය පුහුණුව නිමකල සිසුන්ට බෙදාදීම සඳහා රු. 993,200 ක් වැය කර මහන මැෂින් 52 ක් 2012 දෙසැම්බර් 31 දින මිලදී ගෙන තිබූ අතර, එම මැෂින් 52 න් මැෂින් 15 ක් 2013

නොවැම්බර් 01 දින විගණන අවස්ථාව වන විටත්, එනම් වසරක කාලයක් සීදුව ගබඩාවේ නිෂ්කාර්යව පවතින බව භෞතික පරික්ෂාවේදී අනාවරණය විය.

**2.5.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

(අ) **ළමා නිවාසයක් ඇරඹීම සඳහා** 2009 ඔක්තෝබර් මස දෙපාර්තමේන්තුවට පරිත්‍යාග කරන ලද ගනේමුල්ලේ පිහිටි පර්චස් 348 ඉඩම හා නිවස 2011 ජනවාරි 05 දින දක්වා අරමුණුගත කාර්යයට භාවිතා නොකිරීම නිසා නැවත දීමනාකරු පවරා ගෙන තිබුණි.

(ආ) ළමා නිවාසයක් ආරම්භ කිරීම සඳහා 2010 පෙබරවාරි 07 දින සමාජසේවා දෙපාර්තමේන්තුවට පරිත්‍යාග කරන ලද වරකාපොළ පිහිටි රූඩ් 01 පර්චස් 13 ක ඉඩම විගණන අවස්ථාව වන 2013 ජූලි 17 දින වනවිටත් කිසිදු ප්‍රයෝජනවත් කාර්යයක් සඳහා යොදවා නොතිබුණි.

(ඇ) පරිත්‍යාග වශයෙන් ලද අවිස්සාවේල්ල පුවක්පිටියේ පිහිටි රබර් ඉඩම ආදායමක් ලැබෙන ආකාරයට උපයෝජනය කර නොතිබුණි.

**2.5.3 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම.**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **සමීක්ෂණයට භාජනය නොකළ ආයතන**

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට අදාල 2012 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ 2013 ජූනි 10 දින වන විටත් පවත්වා නොතිබුණි.

(ආ) **භාණ්ඩ ඌනතා හා අතිරික්තතා සම්බන්ධයෙන් කටයුතු කිරීම**

මුදල් රෙගුලාසි 757 (2) හි සඳහන් පරිදි, භාණ්ඩ සමීක්ෂණයේදී අනාවරණය වූ විෂමතා, ඌනතා සහ නැතිවීම් සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරී විසින් මු.රෙ.102 හා මු.රෙ.108 පරිදි කටයුතු කළයුතු වුවත්, දෙපාර්තමේන්තුවට අයත් සීදුව හා කැටවල ලෙව්ල වෘත්තීය පුහුණු ආයතනවලට අදාල 2012 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවලින්

අනාවරණය කර තිබුණු භාණ්ඩ ඌනතා ඒකක 860 ක් හා අතිරික්තතා ඒකක 346 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ඇ) ඉන්වෙන්ට්‍රි ගත නොකළ භාණ්ඩ**

කැටවල ලෙව්ල වෘත්තිය පුහුණු ආයතනයේ භාණ්ඩ වර්ග 141 කින් අයිතම 267ක් ඉන්වෙන්ට්‍රි ගත කර නොතිබුණි.

**2.6 අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| <u>**නීති,රීති හා රෙගුලාසිවලට යොමුව**</u> | <u>**අනුකූල නොවීම්**</u> |
|---|---|
| **(අ)** මුදල් රෙගුලාසි | |
| මුදල් රෙගුලාසි 322(1) | සුරක්ෂිත භාරයේ තබා ඇති මුදල් හෝ මූල්‍ය වටිනාකම් සහිත ද්‍රව්‍ය සම්බන්ධයෙන් නිලධාරියා විසින් සෑමවිටකම සටහන් යාවත්කාලීනව තබා ගතයුතු වුවත්, බාලවයස්කාර ගිණුම් 08 ක් හා ඇප තැන්පත් ගිණුම් 06 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. |
| **(ආ)** සමාජ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ | |
| 1988 ජුනි 22 දිනැති අංක 385 දරන චක්‍රලේඛය | |
| (i) 03(iv) ඡේදය | ස්වේච්ඡා සංවිධානවලට වෘත්තීය උපදේශකවරු සුදුසුකම් සහිත දෙපාර්තමේන්තු අනුමැතිය මත බඳවාගත් පුද්ගලයන් බව තහවුරු කිරීමට සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. |
| (ii) 03 (v) ඡේදය | ස්වේච්ඡා ආයතන විසින් ආබාධිතයින් සඳහා පවත්වන පාඨමාලා පිළිගත් විෂය නිර්දේශයන් අනුව සකස් කර සමාජ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුවත්, එසේ කර නොතිබුණි. |

(iii) 08 (i) ඡේදය

වෘත්තිය පුහුණුව ලබාදෙන මධ්‍යස්ථානවලට විටින් විට ගොස් පුහුණු කටයුතු අධීක්ෂණය කිරීමට, උපදෙස් දීමට, සමාලෝචනය කිරීමට සමාජ සේවා නිලධාරීන්ට සමාජ සේවා සහකාර අධ්‍යක්ෂවරුන්ට, දිසාපතිවරුන්ට බලය පැවරීම සිදුකර තිබුණත්, සමාජ සේවා නිලධාරී වාර්තා මඟින් ප්‍රමාණවත් අවධානයක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සම්බන්ධයෙන් යොමු කර නොතිබුණි.

## 2.7. කාර්යසාධනය

2012 වාර්ෂික අය වැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලසුමට අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) වෘත්තීය අභ්‍යාසලාභීන්ට දෙපාර්තමේන්තුවෙන් ලබාදෙන දීමනා ප්‍රමාද වී ගෙවීමට කටයුතු කර තිබුණි.

(ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මඟින් සමාලෝචිත වර්ෂයේදී වෘත්තීය මෙවලම් කට්ටල 200 ක් ලබා දීමට රු. 2,000,000 ක් වෙන් කර තිබූ නමුත්, වර්ෂය තුළදී රු.1,600,000 ක් වැය කර මෙවලම් කට්ටල 78 ක් පමණක් ලබාදී තිබුණි.

(ඇ) වර්ෂය ආරම්භයේ ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කර තිබූ රු. 1,727,000 ක ප්‍රතිපාදන සළසා තිබුණ ඉදිකිරීම් හා නඩත්තු කටයුතු කාර්යයන් 05 ක් 2012 නොවැම්බර් මස වනවිටත් ආරම්භ කර නොතිබුණු අතර, වර්ෂය අවසානයේ ඉදිරිපත් කළ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මෙන් එය ඉවත් කර තිබුණි.

(ඈ) සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයේදී පැවැත්වීමට සැලසුම් කර තිබුණ පහත සඳහන් වැඩමුළු 02 ක් වර්ෂය තුළදී පවත්වා නොතිබුණි.

| විස්තරය | ඇස්තමේන්තුගත මුදල<br>රු. |
|---|---|
| Workshop on the Update of Curriculum in Vocational Training Centers | 250,000 |
| Workshop on Progress review of | 75,116 |

Vocational Training Centers

(ඉ) දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් නොකළ පහත සඳහන් වැඩසටහන් වර්ෂය තුළ ක්‍රියාත්මක කර තිබුණි.

(i) ජාත්‍යන්තර සම්බන්ධතාව හා මහජන සම්බන්ධතාව පිළිබඳ එක්දින වැඩමුළුව.

(ii) දැව භාණ්ඩ නවීන ආකාරයට නිමාවත් කිරීම පිළිබඳ පුහුණුවැඩසටහන.

(ඊ) වෘත්තීය පුහුණුව ලද ආබාධිත සිසුන්ට ආයතනයෙන් පිටවීමට පෙර මෙවලම් කට්ටල ලබාදීම කළයුතු වුවද, අමුණුකුඹුර, කැටවල ලෙව්ල සහ සුබිත ආයතන වලින් පිටවූ පිළිවෙලින් අභ්‍යාසලාභීන් 40 දෙනෙක්, 05 දෙනෙක් හා 03 දෙනෙකු සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

## 2.8. මතභේදයට තුඩුදෙන ගනුදෙනු

දෙපාර්තමේන්තුව විසින් කර ඇති සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ ගනුදෙනු කිහිපයක විස්තර පහත දැක්වේ.

(අ) "මහා කරුණා" සංවිධානය විසින් එවන ලද පරිගණක 40 ක් යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ වවුනියාවේ ඇති Chen Sulan පරිගණක පාසල වෙත ලබාදෙන ලෙස එම සංවිධානය දන්වා තිබුණ ද, දෙපාර්තමේන්තුවේ සීදුව වෘත්තීය පුහුණු ආයතනයේ ආබාධිත ළමුන්ට බෙදාහැරීමට සමාජ සේවා අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) විසින් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම්ගෙන් අනුමැතියද ඉල්ලා ඇති බව නිරීක්ෂණය විය.

(ආ) වවුනියාව, කුරුණෑගල සහ පොළොන්නරුව දිස්ත්‍රික්කවලට බෙදාහැරීම සඳහා සමාජ සේවා අමාත්‍යාංශය වෙත සිංගප්පූරුවේ "මහා කරුණා" සංවිධානය විසින් අවස්ථා දෙකකදී එවන ලද පරිත්‍යාග තොග නිදහස් කර ගැනීම සඳහා රු.844,356 ක මුදලක් සුභසාධන වැය විෂය යටතේ දරා තිබුණි.

දෙපාර්තමේන්තුව විසින් මෙම භාණ්ඩ නිදහස් කර ගැනීම සඳහා වියදම් දරා තිබුණ ද, භාණ්ඩ එවා තිබුණේ සමාජ සේවා අමාත්‍යාංශය වෙත බව නිරීක්ෂණය විය.

(ඈ) ''මහා කරුණා'' සංවිධානය විසින් ඩොලර් 2120 ක් වටිනා භාණ්ඩ වර්ග 09 ක ඒකක 442 ක් දෙපාර්තමේන්තුව වෙත එවා තිබූ අතර, එම භාණ්ඩ බෙදා හැරීම පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) සීදූව වෘත්තීය පුහුණු ආයතනයට ලැබුණු පරිත්‍යාග ලෙස සඳහන් කර නිදහස් කරගෙන තිබුණු භාණ්ඩ වර්ග 08 ක ඒකක 204 ක් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ආබාධ සහිත ළමුන් සිටින පාසල්, ස්වේච්ඡා සංවිධාන හා වෘත්තීය පුහුණු ආයතනවලට බෙදාදීම පිණිස ලබාදී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඉ) පරිත්‍යාග ලෙස ලැබුණු භාණ්ඩ වර්ග 05 ක ඒකක 60 ක් බෙදා හරින ලද ආකාරය සම්බන්ධයෙන් තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඊ) පුද්ගලයෙකු වෙත ඇමෙරිකා එක්සත් ජනපදයෙන් පරිත්‍යාග ලෙස ලැබුණු පෝෂණ ද්‍රව්‍ය තොගයක් රේගුවෙන් නිදහස් කර ගැනීම වෙනුවෙන් පුද්ගලික ආයතනයක් වෙත රු.220,927 ක මුදලක් දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණු අතර, පරිත්‍යාග භාණ්ඩ හෝ ද්‍රව්‍ය පිළිබඳ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

## 2.9 කළමනාකරණ දුර්වලතා

2012 වර්ෂයේ ජනවාරි සිට අගෝස්තු දක්වා ස්වේච්ඡා සංවිධාන 10 කට රු. 3,244,190 ක් ගෙවා තිබුණද ආබාධිත තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව ලබා දෙන, දෙපාර්තමේන්තුවෙන් ආධාර ලබන ස්වේච්ඡා සංවිධාන රාජ්‍ය නොවන ලේකම් කාර්යාලයේ ලියා පදිංචි කර ඇති බවට පරීක්ෂාකර නොතිබුණි.

## 2.10 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 10 | 08 | 02 |
| (ii) තෘතියික මට්ටම | 164 | 143 | 21 |
| (iii)ද්විතියක මට්ටම | 330 | 295 | 35 |
| (iv)ප්‍රාථමික මට්ටම | 92 | 70 | 22 |
| වෙනත් | 09 | 02 | 07 |
| එකතුව | 605 | 518 | 87 |

(ආ) සමාජ සේවා දෙපාර්තමේන්තුවට අයත් නිලධාරීන් 18 දෙනෙකු වෙනත් ආයතනවල සේවයේ යෙදී සිටි අතර, සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා රු.5,427,852 ක වැටුප් දෙපාර්තමේන්තුව විසින් වැය කර තිබුණි.